# කුකුළු කර්මාන්තයේ අතීත ප්‍රවණතා ඔස්සේ අනාගත විභවතාවන් කරා.....

එම්.ඩී. සුසිලා ලූර්දු
*පර්යේෂණ නිලධාරිණී*
ප්‍රචාරක හා ප්‍රකාශන ඒකකය
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

**දේශීය කෘෂි කර්මාන්තයේ පශු සම්පත් ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන්ම කිරි පට්ටි පාලනය හා කුකුළු පාලනය යන උප අංශ දෙකෙන් සමන්විත වන්නේය. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා පෙන්වා දෙන අන්දමට ඉකුත් 2002 වර්ෂයට සාපේක්ෂව 2003 වසරේ මෙම පශු සම්පත් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය සතුටුදායක මට්ටමක පවතී.**

වත්මන් දේශීය වෙළඳපළ තුළ කුකුළු පාලනයට ඇත්තේ ඉහළ ඉල්ලුමකි. මෙම ඉල්ලුම හේතුකොට ගෙන අනෙකුත් උප අංශ පරදවා මෙය සීඝ්‍රයෙන් වර්ධනය වීම, ගෙවී ගිය දශක දෙක අතුළත දී දැකිය හැකි වූ විශේෂ ලක්ෂණයක් විය. මෙයට බොහෝ විට හේතු වී ඇත්තේ පාරිභෝගිකයාගේ ආදායම් වැඩි වීම, පාරිභෝජන රටාවන් හි සිදුවන වෙනස්කම් හා උතුරු - නැගෙනහිර ප්‍රදේශ මුහුණ දෙන සිවිල් පාලනයට එරෙහි අරගල හේතුවෙන් මාළු මිල ඉහළ යාම වැනි කරුණු ය. දේශීය වෙළඳ පොළ තුළ කුකුළු පාලනය මෙසේ ව්‍යාප්ත වීමත් සමඟ **ප්‍රීමා, ගෝල්ඩ් කොයින්** වැනි බහුජාතික සමාගම් පවා කුකුළු පාලන අංශය වෙනුවෙන් මුදල් ආයෝජනය සිදු කරනු ලැබ තිබේ.

පසුගිය කාලයේ, ශ්‍රී ලංකාව පුරා පැතිර ගිය **කුරුළු උණ** වසංගතය පිළිබඳ බිය හේතුකොට ගෙන කුකුළු කර්මාන්තයේ නිෂ්පාදනය හා අලෙවිය යම්කිසි පසුබෑමකට ලක් වූ බවක් පෙනෙන්නට තිබුන ද දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඉහළ ස්ථානයක පවතින අංශයක් ලෙස මෙය ඉතා වැදගත් වේ. 1998 සංඛ්‍යා ලේඛන පෙන්වා දෙන පරිදි කෘෂිකාර්මික අංශයේ දළ දේශීය නිෂ්පාදනයෙහි 5% ක දායකත්වයක් ලබන පශු සම්පත් අංශයේ, උප අංශයක් වශයෙන් කුකුළු පාලන අංශය, ශ්‍රී ලංකාවේ පශු සම්පත් ජනගහනයෙන් 80% ක් පමණ ආවරණය කරනු ලැබ ඇත. එමෙන්ම, **මහ බැංකු වාර්තා - 2002** පෙන්වා දෙන ආකාරයට කුකුළු පාලන අංශය සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී සහභාගීත්වය හේතු කොට ගෙන කුකුළු මස් නිෂ්පාදනය, මෑත වසර කිහිපය තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන තිබේ. කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය වාර්තා කොට ඇති පරිදි 2002 වසරේ දී කුකුළු මස් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශලක්ෂ 88 ක් දක්වා 26% කින් ඉහළ ගොස් තිබේ. මෙවැනි ප්‍රගතියකට හේතු ලෙස දක්වා ඇත්තේ, සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම නිසා ඇති වූ අධික ඉල්ලුමත්, අඛණ්ඩව බලශක්ති සැපයුමත්, රජයෙන් ලැබුණු දිරිගැන්වීම් ආදියත් වැනි කරුණු ය. එසේ වුව ද, බිත්තර නිෂ්පාදනය නම් දශලක්ෂ 954 දක්වා 1% ක් අඩු වී ඇති බවක් ඔවුහු පෙන්වා දෙති. වසරේ මුල් භාගය තුළ කිකිළියන් අතර පැතිරුණු රෝගී තත්ත්වය නිසා බිත්තර නිෂ්පාදනය අඩු වූ බව එම වාර්තා වල සඳහන් වේ.

කුකුළු නිෂ්පාදනයන් සම්බන්ධයෙන් මෑත කාලීන ප්‍රවණතාවයන් සලකා බලන විට පෙනී යන්නේ (2003 මහ බැංකු වාර්තාවට අනුව), කුකුළු මස් නිෂ්පාදනය 3.6% කින් ඉහළ ගොස් ඇති අතර බිත්තර නිෂ්පාදනය දශ ලක්ෂ 884.8 දක්වා ආන්තිකව අඩු වී තිබෙන බවකි. කෙසේ වුවද, සත්ත්ව ආහාරවල අධික මිල, ශීතකළ ගබඩා කාමර පහසුකම් වැනි යටිතල පහසුකම් නොමැති වීම, නිෂ්පාදකයින්ගේ ලාභ ආන්තිය අඩුවීමට හේතු වන බව සඳහන් කළ හැකිය.

භූගෝලීය වශයෙන් මෙම කුකුළු පාලන ඒකක පැතිරී ඇති ආකාරය පිළිබඳව විමසා බලන විට පෙනී යන්නේ, සෙසු දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව **කුරුණෑගල, ගම්පහ, කොළඹ, පුත්තලම** සහ **කළුතර** යන දිස්ත්‍රික්ක පහ තුළ විශාල වශයෙන් මෙය ඒකරාශී වී ඇති අයුරකි. පහත සඳහන් සංඛ්‍යා සටහනින් පෙන්වා දෙන ආකාරයට ශ්‍රී ලංකාවේ සමස්ත බිත්තර නිෂ්පාදනයෙන් 60% ටම දායක වන්නේ දිස්ත්‍රික්ක පහක් වන බව පෙනේ.

මෙම දිස්ත්‍රික්ක පහ හැරුණු විට සෙසු දිස්ත්‍රික්කයන් හී, බිත්තර නිෂ්පාදන දායකත්වය අනෙක් පිටුවේ ඇති වගුවේ **"වෙනත්"** යන කොටසින් දැක් වේ. ඒ අනුව, එහි දායකත්වය 40% ක් පමණ වේ. එමෙන්ම, බිත්තර නිෂ්පාදන දායකත්වය වැඩි දිස්ත්‍රික්ක පහෙන් ද, **කුරුණෑගල** දිස්ත්‍රික්කය බිත්තර නිෂ්පාදනය අතින් ඉහළ මට්ටමක සිටින බැව් පෙනෙන අතර එය 1998 බිත්තර නිෂ්පාදනයට 1/4 ට වැඩි ප්‍රමාණයක දායකත්වයක් සපයා තිබේ. **කොළඹ** සහ **ගම්පහ** යන දිස්ත්‍රික්කයන් කඩිනමින් නාගරීකරණයට ගොදුරු වීමත්, ඉඩම් සුලභතාවය සීමා වීමත්, හේතුවෙන් බිත්තර නිෂ්පාදනය සීමා වී ඇති බව කිව හැකිය. කුකුළු මස් නිෂ්පාදනය සම්බන්ධයෙන් පවතින සීමිත තොරතුරු වලින් හෙළිවන පරිදි

## බිත්තර නිෂ්පාදනය කරන ප්‍රධාන දිස්ත්‍රික්ක {නිෂ්පාදනය දහස් (000)}

| දිස්ත්‍රික්කය | 1981-1990 | | 1991-1994 | | 1995 | | 1996 | | 1997 | | 1998 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදනය | % | නිෂ්පාදනය | % | නිෂ්පාදනය | % | නිෂ්පාදනය | % | නිෂ්පාදනය | % | නිෂ්පාදනය | % |
| කුරුණෑගල | 99,910 | 15 | 155,757 | 19 | 152,914 | 18 | 184,013 | 22 | 186,122 | 22 | 193,763 | 22 |
| ගම්පහ | 117,070 | 17 | 113,557 | 14 | 108,748 | 13 | 102,173 | 12 | 92,375 | 11 | 106,146 | 12 |
| කොළඹ | 64,934 | 10 | 79,662 | 10 | 82,540 | 10 | 78,598 | 9 | 80,203 | 9 | 73,658 | 8 |
| පුත්තලම | 70,063 | 10 | 79,534 | 10 | 90,218 | 9 | 80,218 | 9 | 81,376 | 10 | 92,477 | 11 |
| කළුතර | 53,814 | 8 | 65,092 | 8 | 72,534 | 8 | 70,681 | 8 | 74,368 | 9 | 76,248 | 9 |
| වෙනත් | 271,618 | 40 | 340,205 | 41 | 352,246 | 41 | 340,175 | 40 | 340,424 | 40 | 335,510 | 38 |
| ශ්‍රී ලංකාව | 676,352 | 100 | 825,652 | 100 | 859,269 | 100 | 855,858 | 100 | 854,868 | 100 | 875,802 | 100 |

*මූලය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

බේරුවල සිට හලාවත දක්වා වූ මුහුදුබඩ පළාත්වල 75% ක් පමණ මස් සඳහා කුකුළන් ඇති කරන බව පෙනේ. බිත්තර නිෂ්පාදනය හා සැපයුම වැඩි වශයෙන් කෙරෙන්නේ **කුලියාපිටිය** ප්‍රදේශයෙන් වන අතර වැඩි වශයෙන් කුකුළු මස් පාරිභෝජනය කරන **කොළඹට**, මස් සපයන්නේ **මීගමුව** ප්‍රදේශයෙනි. ඒ අනුව **මීගමුව** සිට **කොළඹ** දක්වා ප්‍රදේශයන් හි කුකුළු මස් නිෂ්පාදනය වැඩි වශයෙන් කෙරෙන බව පැහැදිලි වේ.

කුකුළු නිෂ්පාදනයන් සම්බන්ධයෙන් අතීත ප්‍රවණතා පිළිබඳ සලකා බලන විට, 60 දශකයේ මුල් කාලයේ සිට 70 දශකය අතරතුර කාලයේ බිත්තර නිෂ්පාදනයේ වාර්ෂික වැඩිවීම 11% ක් ලෙස වාර්තා වේ. මිලියන 173 සිට මිලියන 662 දක්වා එය වැඩි වී තිබේ. කෙසේ වුව ද, 1973 සිට 1979 අතර කාලය තුළ බිත්තර කර්මාන්තයේ කිසිදු වැඩි දියුණුවක් දැකිය නොහැකි වී ඇති අතර මෙම කාලයේ දී බිත්තර නිෂ්පාදනයේ පිරිහීම වාර්ෂිකව 9% ක් ලෙස වාර්තා වී තිබේ. 1978 වසරේ දී මෙම නිෂ්පාදනය බිත්තර මිලියන 360 ක තත්ත්ව -යට පත් වී ඇත. නැවතත් 1979 සිට 1987 දක්වා කාලය තුළ දී, බිත්තර නිෂ්පාදනයේ වාර්ෂික වර්ධනය 9% ක් බවට පත්ව තිබේ. අනතුරුව බිත්තර නිෂ්පාදන -යේ කිසිදු කැපී පෙනෙන වර්ධන -යක් පෙන්නුම් නොකළ අතර එය 1993 දක්වාම මිලියන 853 ක් වැනි ප්‍රමාණයක (මට්ටමක) තිබුණි. 1998 දී, බිත්තර නිෂ්පාදනය මිලියන 875 ක් වූ අතර එය මෙතෙක් වාර්තා වූ වැඩිම බිත්තර නිෂ්පාදනය යි.

කුකුළු මස් නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනයත් සමඟ සසඳා බලන විට පැහැදිලි වෙනසක් පෙන්නුම් කරනු ලබයි. 1980 වර්ෂයේ මැද භාගය වන විට, වාර්ෂික කුකුළු මස් නිෂ්පාදනය මෙ.ටො. 30,000 ක ප්‍රමාණයක පැවති අතර එහි වර්ධනයක් පෙන්නුම් නොකළේය. කෙසේ වෙතත්, 1990 වර්ෂයේ සිට කුකුළු මස් නිෂ්පාදනයේ ක්ෂණික වර්ධනයක් වාර්තා වී තිබේ. 1991 වර්ෂයේ දී, මෙ.ටො. 14,800 ක්ව තිබූ මස් නිෂ්පාදනය 1998 වන විට, මෙ.ටො. 52,800 බවට වර්ධනය වී තිබේ. ඒ අනුව, වසර අටක කාලයක් තුළ දී, කුකුළු මස් නිෂ්පාදනය 26% ක වර්ධනයක් පෙන්නුම් කර තිබෙන බව පෙනේ. මෙයට හේතු ලෙස පෙන්වා දී තිබෙන්නේ **ඉදිරි ගිවිසුම් ක්‍රමය (Buy - Back System)** වැනි ක්‍රම මඟින් නිෂ්පාදකයා සහ ගැණුම්කරුවා අතර ඇති වන ගිවිසුම හේතු කොට ගෙන මස් නිෂ්පාදනයට අවශ්‍ය සියලුම යෙදවුම් අවශ්‍යතා, ගැනුම්කරුවා විසින් සැපයීම හා එම නිසා, 1990 කාල වකවානුව වන විට, නිෂ්පාදකයන් රාශියක් කුකුළු කර්මාන්තය තුළට එකතු වීම යි.

සාමාන්‍යයෙන් කුකුළු පාලනය පවුලේ ව්‍යාපාරයක් ලෙස සලකනු ලබන අතර සෙසු වගා නිෂ්පාදනයන් හා සසඳන කල්හි කුකුළු පාලනය සඳහා අවශ්‍ය වන්නේ අඩු ශ්‍රම දායකත්වයක් වීම විශේෂ ලක්ෂණයකි. සතුන් 1000 ක් ඇති කිරීමේ දී ප්‍රධාන වශයෙන් එම සතුන්ට කෑම, වතුර සැපයීම සහ බිත්තර පිරිසිදු කිරීම සඳහා දිනකට එක් පුද්ගලයෙකුට පැය පහක් පමණ වැය වන බව සඳහන් ය. ක්ෂේත්‍ර විමර්ශනයන් ගෙන් අනාවරණය වන පරිදි, කුකුළු පාලනයෙහි නියැළෙන බොහොමයක් පවුල්වල ප්‍රධාන ආදායම් මාර්ගය වී ඇත්තේ ද මෙම ව්‍යාපාරයයි. එමෙන්ම, විශ්‍රාමික පුද්ගලයන් සහ කාන්තාවන් විශාල සංඛ්‍යාවක් කුකුළු පාලනයෙහි නියැළෙන බව ද දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයකි.

කුකුළු පාලනයෙහි නිෂ්පාදන පිරිවැය පිළිබඳව සලකා බලන විට පෙනී යන්නේ බිත්තර නිෂ්පාදනයේ දී මෙන්ම මස් නිෂ්පාදනයේ දීත් ප්‍රධාන පිරිවැය අයිතමය වන්නේ කෑම සඳහා වැය වන පිරිවැය බවයි. එමඟින්, විස්තර කෙරෙන්නේ දිනක් වයසැති කුකුළු පැටවුන්ගේ පිරිවැය 29% ක් වන අතර ආහාර සඳහා වන පිරිවැය 63% ක් වන බවයි. දින 42-45 ක් වැනි කෙටිකාලීන නිෂ්පාදන චක්‍රයක් පැවතීම හේතුකොට ගෙන මස් නිෂ්පාදන පිරිවැය, බිත්තර නිෂ්පාදන පිරිවැයට වඩා අඩු වේ. **කුකුළු පාලනයේ දී ගොවියාට ආදායම් ලැබෙන මූලාශ්‍ර කිහිපයක් තිබේ.** බිත්තර විකිණීම, බිත්තර නොදමන කිකිළියන් විකිණීම, ජීව පොහොර විකිණීම හා හිස් මළු විකිණීම මෙම මූලාශ්‍ර වේ. මෙහි දී කැපී පෙනෙන කරුණ වන්නේ බිත්තර ගොවිපළෙන් ලැබෙන

සමස්ත ආදායමෙන් 6% ක් පමණ නියෝජනය කරන්නේ කාලය ඉක්ම වූ කිකිළියන් විකිණීමෙන් ලැබෙන ආදායම මඟින් බවයි. කෙසේ වුව ද, ගොවිපලේ සමස්ත ආදායමට බලපෑම් කරන වෙනත් ආධාරක ආදායම් මාර්ග අමතක කළහොත් බිත්තර නිෂ්පාදනයෙහි පිරිවැය හා බිත්තර මිල සන්සන්දනය කිරීමේ දී පෙනී යන්නේ බිත්තර නිෂ්පාදනය එතරම්ම ලාභදායක කාර්යයක් නොවන බවයි. මස් පිණිස කුකුළන් ඇති කරන විට කුඩා පරිමාණ ගොවිපළ වලින් වැඩි ලාභදායකත්වයක් නොලැබෙන හෙයින් ඒ හේතුකොට ගෙන බොහෝ ගොවිපල වල සතුන් 5000 ට වැඩියෙන් සිටින බව දක්නට ලැබේ.

කුකුළු මස් අලෙවි පද්ධතිය, බිත්තර අලෙවි පද්ධතියට වඩා තරමක් වෙනස් වේ.

කුකුළු නිෂ්පාදන වෙළඳ - පළ පිළිබඳව විමර්ශනය කිරීමේ දී, නිෂ්පාදන මට්ටමේ අලෙවි සැල් රාශියක් පවතින බව පෙන්වා දිය හැකිය. එසේ වුවද, ප්‍රාදේශීය තත්ත්වයන් අනුව, එක් එක් අලෙවි නාලිකාවන් හි වැදගත් කම වෙනස් වේ. **කුලියාපිටිය** වැනි ප්‍රදේශවල කුකුළු ගොවීන් තම බිත්තර **කොළඹ** තොග වෙළඳුන්ට අලෙවි කරන අතර ගම්පහ වැනි ප්‍රදේශයන් හි ගොවීන් තම බිත්තර සුළු වෙළඳුන්ට අලෙවි කරනු ලබයි. එසේ කිරීමට හේතුව වන්නේ, **ගම්පහ** වැනි දිස්ත්‍රික්කයන් හි සිටින අති විශාල පාරිභෝගික සංඛ්‍යාව හේතුවෙන් නිෂ්පාදන, එම ප්‍රදේශය තුළම ප්‍රයෝජනයට ගැනීමයි. මීට අමතරව **අනුරාධපුර** හා **පොළොන්නරුව** වැනි දුරස්ථ ප්‍රදේශ වලින් පැමිණෙන ප්‍රාදේශීය තොග වෙළඳුන්ට ද බිත්තර විකිණීම සිදු වේ. **කුකුළු මස් අලෙවි පද්ධතිය, බිත්තර අලෙවි පද්ධතියට වඩා තරමක් වෙනස් වේ.** මෙයට හේතු වී ඇත්තේ යෙදවුම් - සැපයුම, නිෂ්පාදනය හා අලෙවිය බොහෝ විට ඒකාබද්ධව තිබෙන නිසා අලෙවිය සහතික වීමේ ප්‍රවණතාවයක් දක්නට හැකි වීමයි. මෙම ක්‍රියාවලියේ දී ආහාර නිෂ්පාදන සමාගම් සිය නියෝජිතයින් මඟින් ජීව සතුන් මිල දී ගනු ලබයි. ඊට අමතරව, ප්‍රාදේශීය වශයෙන් ජීවී සතුන් එකතු කරන්නන් හට ද සතුන් අලෙවි කරනු ලබයි.

**ශ්‍රී ලංකාව පුරා අඩු වැඩි වශයෙන් ව්‍යාප්තව පවතින මෙම කුකුළු කර්මාන්තයේ යෙදී සිටින්නන්ට තම නිෂ්පාදනයන් ගෙන් ඉතා විශාල පාඩුවක් සිදු නොවන බව පෙනී යන අතර ඉතා විශාල ලාභයක් හිමි නොවන බව ද සඳහන් කළ යුතුය.** කෙසේ වුව ද, අතීතයේ පටන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයන් තුළ වැඩි වැදගත් කමක් උසුලමින් කෙරීගෙන යන මෙම කුකුළු කර්මාන්තයේ ඵලදායකත්වය වර්ධනය කරනු සඳහා කළ යුතු නිර්දේශයන් කිහිපයක් මෙහි පහත සඳහන් ය. ඒ අනුව, රට පුරා විහිදී පැතිරී සිටින නිෂ්පාදකයින්ගේ කළමනාකරණ කුසලතා වර්ධනය කිරීම තුළින් නිෂ්පාදන ක්‍රියාශීලීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය වූ ගොවිපළ කළමනාකරණ පුහුණු පාඨමාලා පැවැත්වීම වැනි ක්‍රියාවන් ආරම්භ කිරීමත්, එමඟින් නිෂ්පාදනයන් හී, ඒකක පිරිවැය අවම කොට පාරිභෝගිකයාට අඩු මිලට නිෂ්පාදන සැපයීමෙන් වෙළඳපළ ව්‍යාප්තියක් ඇති කිරීම ද, කුකුළු ආහාර පිරිවැය, සමස්ත පිරිවැයට විශාල බලපෑමක් කරන හෙයින් ආහාර සඳහා වන පිරිවැය අඩු කිරීමේ ක්‍රමෝපායයන් සහ විධික්‍රම සොයා බැලීම ද කළ යුතු වේ. එහි දී, 90% කට වඩා විදේශ

ශ්‍රී ලංකාව පුරා අඩු වැඩි වශයෙන් ව්‍යාප්තව පවතින මෙම කුකුළු කර්මාන්තයේ යෙදී සිටින්නන්ට තම නිෂ්පාදනයන් ගෙන් ඉතා විශාල පාඩුවක් සිදු නොවන බව පෙනී යන අතර ඉතා විශාල ලාභයක් හිමි නොවන බව ද සඳහන් කළ යුතුය.

වලින් ආනයනය කරන කුකුළු ආහාර අමුද්‍රව්‍ය වූ **බඩ ඉරිඟු** සහ **සෝයා,** දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ මං හෙළි කර ගැනීම විශේෂයෙන්ම කළ යුතු ය. මහා පරිමාන නිෂ්පාදකයින් / වෙළඳුන් සුළු පිරිසකගේ ආධිපත්‍ය -යට හසු වී පවතින මෙම ව්‍යාපාරය එම තත්ත්වයෙන් මුදා ගත යුතුය. මේ සඳහා **මැලේසියා**වේ පවතින මිල ඉහළ දැමීමට තමන්ගේ තොග විස්තර සපයමින් රජයේ අනුමැතිය ගැනීමේ රීතිය ශ්‍රී ලංකාවට ද නිදසුනක් සේ පෙන්වා දිය හැකිය. මෙමඟින් වෙළඳපල විනිවිද භාවය ඇති කළ හැකි වේ. එමෙන්ම, නව වෙළඳ සැල් / නාලිකා ස්ථාපිත කිරීමෙන් සහ වෙළඳපළ මිල ගණන් විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කිරීමෙන් වෙළඳපළ තරඟකාරීත්වයක් බිහි කිරීම ද, උචිත ඉහළ තාක්ෂණය උපරිම ලෙස භාවිතා කරමින් නිෂ්පාදනය කරන ආනයනික භාණ්ඩ හා සමඟ තරඟ කිරීමට තරම් මෙරටේ වත්මන් නිෂ්පාදන කාර්යක්ෂමභාවය ප්‍රමාණවත් නොවන නිසා දේශීය නිෂ්පාදන යම් මට්ටමක කාර්යක්ෂමතාවයකට පත්වන තුරු වත් ආනයන ආරක්ෂණයක් ඇති කිරීම ද අවශ්‍ය වේ. එමෙන්ම, කුකුළු කර්මාන්තය පමණක් නොව දේශීය වශයෙන් ඇති කුමන කර්මාන්තයක් වුව ද, අන්තර් ජාතික වෙළඳපලවල් හා සම්බන්ධ වීමට පෙර දේශීය වෙළඳපළ තුළ තම, තරඟකාරීත්වය තහවුරු කර ගත යුතු වේ. ඒ අනුව, දේශීය කර්මාන්තයේ විශේෂිත ක්ෂේත්‍රයක් වන මෙම කුකුළු කර්මාන්තය නඟා සිටුවීමට කටයුතු කිරීම, අදටත් හෙටටත් මතුවටත් කෘෂිකර්මාන්තයේ උන්නතියට ඉවහල් වන බව සටහන් කළ හැකිය.

*(හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් කළ "ශ්‍රී ලංකාවේ බිත්තර හා කුකුළු මස් නිෂ්පාදනය හා අලෙවිය" නම් පර්යේෂණ වාර්තාව ඇසුරින් සකස් කරන ලදී.)*